
# ශේෂිතයා

## දිවි ගලවා ගත් තැනැත්තා

## (Survivor)

GENDER JUSTICE & SECURITY
A GCRF HUB



# හැඳින්වීම

- මේ මාර්ගෝපදේශ අදාළ වන්නේ

  a) ස්ත්‍රී/පුරුෂ සමාජභාවය මත පදනම් වූ ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිත-ශේෂිතයන් (Victim-Survivors),

  b) පැමිණිලි සටහන් තබන පොලිසිය,

  c) වෛද්‍ය පරීක්ෂණ මෙහෙයවන අධිකරණ වෛද්‍ය නිලධාරීන් ( JMO),

  d) ශේෂිතයාට සහාය ලබාදෙන හිතෛෂිවන්තයා/ මානව හිමිකම් නීතිඥයා හෝ සංවිධානයටයි

මෙකී වෙනස් කණ්ඩායම් හතරේ ප්‍රයෝජනය උදෙසා මාර්ගෝපදේශ කොටස් හතරකට බෙදා ඇත. පැමිණිල්ලට අදාළව වෛද්‍ය සහ නීතිමය ක්‍රියාවලිය සඳහා ඉක්මන් යොමු කිරීමක් ඔවුන් වෙතින් ලබාගත හැකිය.

- ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ඉහළ අගයක් ගනී. 2020දී පමණක් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ (වයස අවුරුදු 16ට අඩු ගැහැනු ළමුන් දූෂණය කිරීම්) සිද්ධි 1391ක් සහ ස්ත්‍රී දූෂණ (වයස අවුරුදු 16ට වඩා වැඩි කාන්තාවන් දූෂණය කිරීම්) 257ක් පොලිසියට වාර්තා වී ඇත.

- (https://www.police.lk/wp-content/uploads/2023/07/GRAVE-CRIME-ABSTRACT-FOR-WHOLE-ISLAND-FROM-01.01.2022-TO-31.12.2022.pdf බලන්න.)

වයස අවුරුදු 16 ට වැඩි කාන්තාවන් දූෂණය කිරීමේ අපරාධ 2020 සිට 2021 වන විට අපරාධ 300 සිට 256 දක්වා අඩුවීමක් ඇත. 2022 වසරේ වාර්තා වූ සිද්ධි සංඛ්‍යාව 257කි. අපරාධ විසඳීමේ ප්‍රතිශතය සැලකිල්ලට ගත් විට 2020 වසරේ විසඳුම් ප්‍රතිශතය 94%ක් වූ අතර, 2021දී විසඳුම් ප්‍රතිශතය 96%ක් එනම්, 15 %කින් ඉහළ ගොස් ඇත. මේ ප්‍රතිශතය 2022 දී 92%ක නිශ්චිත අඩුවීමක් පෙන්නුම් කර ඇත.

වයස අවුරුදු 16ට අඩු වින්දිතයාගේ කැමැත්ත මත වන දූෂණ යටතේ වාර්තා වන වැඩිම අපරාධ සංඛ්‍යාව සලකා බැලීමේදී වගුවේ දැක්වෙන ආකාරයට වසර තුනේදීම එහි වැඩිවීමක් සිදුව ඇත.

2020 දී අපරාධ 1292 ක් වාර්තා වී ඇත; ඊට සාපේක්ෂව 2021 දී අපරාධ සංඛ්‍යාව 1377ක් වැඩි වී ඇත. 2022 දී එය 1391ක් දක්වා වැඩිවීමක් සටහන් කර ඇත. මෙම අපරාධ විසඳීමේ ප්‍රතිශතය 2020 දී 98%ක් සහ 2021 සහ 2022 දී අනුපිළිවෙළින් 97%ක් සහ 96% කි.

2020 වෂර්යේදී බරපතල ලිංගික අපයෝජන සිද්ධි 677ක් වාර්තා වී ඇති අතර, ඊට සාපේක්ෂව 2021 දී එම අපරාධ සංඛ්‍යාව 649 දක්වා අඩු වී ඇත. එය 2022 දී 571 දක්වා පහළ වැටී ඇති අතර, විසඳීමේ ප්‍රතිශතය ද 2021 දී 96% සිට 2022 වන විට 95% දක්වා අඩු වී ඇත. (https://parliament.lk/uploads/documents/paperspresented/1689659159014196.pdf)

2024 ජනවාරි 04 සිට මාර්තු 10 දක්වා ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීමේ කාර්යාංශයේ ස්ථාපිත විශේෂ ඒකකයට '109' අංකය හරහා කාන්තාවන් හා ළමයින්ට එරෙහි අපයෝජන, ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් සම්බන්ධ පැමිණිලි 1,077ක් ලැබී ඇත. ( https://www.adaderana.lk/news.php?nid=98185 )

GENDER JUSTICE & SECURITY
A GCRF HUB

- ශ්‍රී ලංකාවේ ලිංගික ප්‍රචණ්ඩත්වය සත්‍ය සිදුවීම් පොලිසියට වාර්තා වූ ප්‍රමාණයට වඩා වැඩිය. වාර්තා නොකිරීමට බොහෝ හේතු තිබුණත්, ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණවල දී සහ දිවි ගලවා ගත් අය සමඟ සාකච්ඡා කිරීමේ දී හෙළි වූයේ, දිවි ගලවා ගත් අයෙකු අනුගමනය කළ යුතු ක්‍රියාවලියේ හිඩැස් සහ මෙම ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත්භාවය නොමැතිකමයි.

- තමන්ට මුහුණදීමට සිදු වූ ප්‍රචණ්ඩත්වය /හිංසනය හේතුවෙන් දැනටමත් කායික හා මානසික පීඩාවෙන් පෙළෙන ශේෂිතයන්ට මෙමඟින් තවත් දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වෙයි.

- එබැවින් හිතෛෂිවන්තයකු යනු (පවුලේ සාමාජිකයකු, වැඩිහිටි මිතුරකු, නීතිඥයකු, මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින්නකු හෝ රාජ්‍ය නොවන සංවිධානයක්, සිවිල් සමාජ සංවිධානයක් හෝ කාන්තා සංවිධානයක්) ශේෂිතයා වෙනුවෙන් පෙනී සිටින, ශේෂිතයාට විශ්වාසය තැබිය හැකි වැදගත් පුද්ගලයෙකි.

- හිතෛෂිවන්තයා, ශේෂිතයා පැමිණිලි කිරීමේ අවස්ථාවේ සිට උසාවි කටයුතු ක්‍රියාවලිය සහ ඉන් පසුවත් ඔහු හෝ ඇය සමඟ දී රැඳී සිටීම වැදගත්ය. මෙම මාර්ගෝපදේශ, ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට ශේෂිතයා ප්‍රවේශ වීමේදී ඒ සඳහා හිතෛෂිවන්තයාට සහාය විය හැකි ආකාරය ගැන  පියවරෙන් පියවර ඉදිරිපත් කරයි.

GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# සිදුවීම සහ ක්‍රියාපටිපාටිය

# පළමු පියවර

ඔබට හිංසනයට මුහුණ දීමට සිදුවූ වහාම වැඩිහිටි හිතෛෂිවන්තයකු සමඟ කතා කරන්න. (පවුලේ සාමාජිකයෙක්/ මිතුරෙක්/ උපදේශකයෙක්/ නීතිඥයෙක්/ කාන්තා හෝ මානව හිමිකම් සංවිධානයක සාමාජිකයෙක්) සිදු වූ දෙය ගැන පවසා ඔවුන්ගේ සහාය සහ ආරක්ෂාව ලබාගන්න.



පවුලේ සාමාජිකයකු



උපදේශකයෙක්



මිතුරෙක්




නීතිඥයෙක්



කාන්තා අයිතිවාසිකම්/ ස්ත්‍රී-පුරුෂභාවය සහ ලිංගික අයිතිවාසිකම් සංවිධානයක නියෝජිතයෙක්

GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# මුල් පියවර

- ඔබට හදිසි අවධානයක් අවශ්‍ය වන ශාරීරික තුවාල සිදුව ඇත්නම්, හැකි ඉක්මනින් ප්‍රතිකාර සඳහා රෝහලකට ඇතුළත් වන්න.
- හදිසි ඇමතුම් අංක 119 අමතා පොලිසිය සම්බන්ධ කර ගත හැකිය.
- ඔබට තර්ජනයක් එල්ලවන්නේ නම් තාවකාලිකව රැඳී සිටීමට ආරක්ෂිත ස්ථානයක් ඔබේ ප්‍රදේශයේ කාන්තා සංවිධානයක් සම්බන්ධ කරගෙන සොයාගත හැකිය.
- අධිකරණ වෛද්‍ය නිලධාරියකු (JMO) විසින් පරික්ෂා කරන තෙක්, ප්‍රහාරයෙන් පසුව ශරීරය සෝදා නොගැනීමත්, ඇඳ සිටි ඇඳුම් මාරු නොකිරීමත් වඩාත් සුදුසුය.



# මුල් පියවර








- යම් හෙයකින් ප්‍රහාරය/ හිංසනය සිදුවූ අවස්ථාවේ ඇඳ සිටි ඇඳුම් මාරු කිරීමට සිදුවුවහොත්, ඒවා සේදීමෙන් වළකින්න.
- ඇඳුම් සහ සෙසු සාක්ෂි කඩදාසි බෑගයක දමා හෝ පුවත්පතක ඔතා තබන්න. ඔබ ඒවා ප්ලාස්ටික් බෑගයක තැබුවහොත් එහි දිලීර පැතිරෙනු  ඇත. ඒ නිසා එයින් වළකින්න. මෙම ඇඳුම් සහ සෙසු සාක්ෂි පොලිසියට සහ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාට පෙන්වන්න.
- අපරාධකරු සමඟ ඔබට තිබූ ශාරීරික හෝ ඕනෑම ආකාරයේ සම්බන්ධතාවක් පිළිබඳ සාක්ෂි ඇති නම්  ඒවා ආරක්ෂා කරගන්න.
- සාක්ෂි වශයෙන් කොන්ඩම්, ඇඳුම් පැලඳුම්, උපාංග, කෙටි පණිවුඩ, ශරීරය පිසදැමීමට භාවිත කළ රෙදි කැබලි ආදිය ඇතුළත් විය හැකිය.



# පොලිස් පැමිණිලි ක්‍රියාපටිපාටිය

පහත සඳහන් ලේඛන පොලිසියෙන් ඉල්ලා සිටිනු ඇත:

- **ජාතික හැඳුනුම්පත** හෝ උප්පැන්න සහතිකය **සහ විවාහ සහතිකය (විවාහක නම්)**

ස්ත්‍රී දූෂණයක් සිදුවුවහොත් පැමිණිලිකරු හැකි ඉක්මනින් පැමිණිල්ල ඉදිරිපත් කළ යුතුය, එය පැමිණිලිකරුගේ වාසියට හේතු වෙයි.*

- මූලාශ්‍රය: රජයේ තොරතුරු මධ්‍යස්ථානය.

වරදක් සම්බන්ධයෙන් ඕනෑම තොරතුරක් වාචිකව හෝ ලිඛිතව පොලිස් නිලධාරියකුට ලබා දිය හැකිය.

ශේෂිතයා අන්තජර්ාලය හරහා පැමිණිල්ලක් කිරීමට තෝරා ගන්නේ නම්, ඇයට/ඔහුට පහත සබැඳිය භාවිත කළ හැකිය.

https://gic.gov.lk/gic/index.php/en/component/complaints/?id=479&task බලන්න.**



*රජයේ තොරතුරු මධ්‍යස්ථානයට අනුව

**අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 109 (1) වගන්තියට අනුව



- හිතෛෂිවන්තයකු හෝ සමීපතමයකු සමඟ පැමිණිල්ල ඉදිරිපත් කිරීමට පොලිස් ස්ථානයට යන්න.
- අපරාධය සිදු වූ අවස්ථාවේ ඔබ ඇඳ සිටි ඇඳුම් මෙන්ම සෙසු සියලුම සාක්ෂි සහ ලේඛන (ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය) පොලිස් ස්ථානයට රැගෙන යන්න.
- වෛද්‍ය පරීක්ෂණයට තමන් සතු සියලුම සාක්ෂි ද රැගෙන යන්න..
- පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කිසිදු ගාස්තුවක් අය කරනු නොලැබේ.
- පොලිස් ස්ථානයේදී කාන්තා හා ළමා කාර්යාංශය විසින් ඔබේ පැමිණිල්ල භාර ගනු ලැබේ. ඔබේ පැමිණිල්ල භාර ගැනීමට පොලිසිය නීතියෙන් බැඳී ඇත. (අපරාධ ක්‍රියා පටිපාටි සංග්‍රහය, 109 වගන්තිය)
- සමහර උප පොලිස් ස්ථානවල කාන්තා හා ළමා කාර්යාංශය නොතිබිය හැකි බවත් කරුණාවෙන් සලකන්න. එවිට ඔබේ පැමිණිල්ල උප පොලිස් ස්ථානයේ අපරාධ කොට්ඨාශයේ පොලිස් නිලධාරියකු විසින් සටහන් කරගනු ලැබේ.
- මේ වෙනුවෙන් කිසිම අයදුම්පතක් පිරවිය යුතු නැත.

- පැමිණිල්ල ලියා ඇති භාෂාව ඔබට නොතේරෙන්නේ නම්, එය ඔබට වැටහෙන භාෂාවකින් පොලිස් ස්ථානය තුළදීම අර්ථකතනය / පරිවර්තනය කළ යුතුය.
- සමහර අවස්ථාවල ස්ථානාධිපතිවරයාගේ අභිමතය පරිදි අවශ්‍ය භාෂා නිපුණත්වය ඇති ආසන්න පොලිස් ස්ථානයක නිලධාරියකු කැඳවා පැමිණිල්ල අර්ථකතනය/පරිවර්තනය කර දෙන ලෙස ඉල්ලීමක් කළ හැකිය.
- ඔබ කැමති භාෂාවෙන් පැමිණිල්ල වාර්තා කිරීමට හෝ පරිවර්තනය කිරීමට පොලිසිය සෑම සාධාරණ උත්සාහයක්ම දැරිය යුතු වේ. *
- පැමිණිල්ල ඉදිරිපත් කරන විට, ඔබට මතක සියලුම තොරතුරු, හැකි නම් ඒවා සිදුවූ අනුපිළිවෙළින් පවසන්න.
- අපරාධය සිදුවන අතරතුර හෝ ඊට පෙර මත්ද්‍රව්‍යයක් ලබා දී ඇතැයි ඔබ සිතන්නේ නම් එය පොලිසියට දන්වන්න. මෙය කැමැත්ත පිළිබඳ කාරණයට අදාළ වේ.




*ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 (1) සහ (2) ව්‍යවස්ථාවට අනුව සිංහල සහ දෙමළ රාජ්‍ය භාෂා ලෙස පිළිගනී; 19 වැනි ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිංහල සහ දෙමළ ජාතික භාෂා ලෙස පිළිගැනේ.

•පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් පසුව එය කියවා බලන ලෙස ඔබෙන් ඉල්ලීමක් කරනු ඇත. එය නිවැරැදිව සටහන් කර ඇති බවට තහවුරු කර අත්සන් කරන්න.

•පැමිණිල්ල ප්‍රවේශමෙන් කියවා බලා, ඔබට අවශ්‍ය නම් යම් වෙනස් කිරීමක්/ නිවැරැදි කිරීමක් සිදු කළ හැකිය.

- ඕනෑම වෙනස් කිරීමක්/නිවැරැදි කිරීමක් මතම ඔබේ නමේ මුලකුරු සමඟ නම ලියා පැමිණිල්ල නිවැරැදි බව තහවුරු කරමින් අත්සන යොදන්න.
- පොලිස් නිලධාරියා එය පැමිණිලි තොරතුරු පොතේ (CIB ) අලවනු ඇත.
- ඔබ පැමිණිල්ල පිළිගැනීමේ රිසිට්පතක් ලබා ගත යුතුය. මෙම රිසිට්පතේ පැමිණිලි යොමු අංකය (පිටු අංකය, එය සටහන් කළ පොලිස් නිලධාරියාගේ නම සහ පැමිණිල්ල කළ දිනය) සටහන්ව ඇත. එය ආරක්ෂිතව තබාගන්න.
- අදාළ වරද ලිංගිකමය ස්වභාවයේ වරදක් වන අවස්ථාවක දී, වරද පිළිබඳ විමර්ශනයට හෝ පරීක්ෂණය සිදු කළ යුතු නිලධාරියාගේ ස්ත්‍රී පුරුෂභාවය නිශ්චිතව සඳහන් කිරීමට ඔබට අයිතියක් ඇත. ඊට අනුකූල වීමට සියලු උත්සාහයන් දැරීමට රජයට යුතුකමක් ඇත. (2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීම පිළිබඳ පනතේ 3(1)(උ) වගන්තිය සහ 3(2) වගන්තිය).



- කිසියම් රාජ්‍ය නිලධාරියකු පැමිණිල්ල භාරගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඔබව බිය ගැන්වීමට හෝ පැමිණිල්ල සිදු කිරීමට එරෙහිව උපදෙස් දෙන්නේ නම් ඔබට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට (HRCSL) පැමිණිල්ලක් කළ හැකිය.

- එසේම මාර්ගගත ක්‍රමය යටතේ 'ටෙල් අයිජීපී' භාවිත කරමින් පොලිස්පතිට ලියාදැන්විය හැකිය. එවිට පැමිණිල්ලේ සාක්ෂි රඳවා තබාගත හැකිය. (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා වාර්තාව බලන්න.):

https://www.hrcsl.lk/make-a-complaint/‘Tell IGP’).

- ශ්‍රී ලංකාවේ නීතිය යටතේ පොලිසියට පැමිණිල්ලක් සටහන් කිරීම ප්‍රතික්ෂේප කළ නොහැකි බව කරුණාවෙන් සලකන්න. (109 වගන්තිය, අපරාධ නඩු විභාග සංග්‍රහ පනත.)

- ඔබේ පැමිණිල්ල පිළිබඳ වාර්තාවක් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට පොලිස් ස්ථානාධිපතිවරයා නීතියෙන් බැඳී සිටියි. (අපරාධ නඩු විධාන සංග්‍රහයේ 109 (5) වගන්තිය.)



# වෛද්‍ය පරීක්ෂණය



# වෛද්‍ය පරීක්ෂණය




•පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පසුව ඔබව අධිකරණ වෛද්‍ය නිලධාරිවරයකු (JMO) විසින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළ යුතුය.

•එබැවින් පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් පසුව පොලිසිය විසින් ඔබව කැඳවාගෙන ගොස්, අදාළ පරීක්ෂණය සඳහා ළඟම ඇති රෝහලට ඇතුළත් කරනු ඇත.

•පළමුව ඔබව රෝහලේදී ලියාපදිංචි කරනු ඇත. ඉන්පසුව වෛද්‍ය පරීක්ෂණය සඳහා ඔබව JMO කාර්යාලයට යොමු කරනු ඇත.

•ග්‍රාමීය ප්‍රදේශවල මෙය හිංසනයට DMO කාර්යාලය විය හැකිය.




•අපරාධය සිදුවීමෙන් පසුව පැමිණිල්ල කිරීමට කෙළින්ම පොලිසියට නොගොස් තුවාලවලට ප්‍රතිකාර ගැනීමට රෝහලට ගියේ නම් ඔබ විසින් පැමිණිල්ල කළ යුත්තේ රෝහල් පොලිසියටයි.


•මෙය සිදුවිය යුත්තේ ඔබ රෝහලේ ලියාපදිංචි වී ප්‍රතිකාර ගැනීමෙන් පසුවය.

•එම අපරාධයක වින්දිතයා වෛද්‍ය පරීක්ෂණයකට ලක් කරනු ලැබිය යුතු කාන්තාවක් වන අවස්ථාවක දී, කාන්තා වෛද්‍ය වෘත්තිකයෙකු විසින් පරීක්ෂා කරන ලෙස ඉල්ලා සිටීමට ද අයිතියක් ඇත. ඊට අනුකූල වීමට සියලු උත්සාහයන් දැරීමට රජයට යුතුකමක් ඇත. (2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීම පිළිබඳ පනතේ 3(1)(ඊ) වගන්තිය සහ 3(2) වගන්තිය).

GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# කැමැත්ත

- ඔබ ඔසප් දින ගත කරන විට පවා JMO හට සාක්ෂි ලබාගත හැකි බව මතක තබාගන්න. මෙහිදී JMO හට වෙනත් සාක්ෂි ලබාගත හැකිය (උදා: සපාකෑම්, සීරීම්). ඔබ ඔසප් දින ගත කරන්නේ නම් JMO විසින් වෙනත් දිනයක සවිස්තරාත්මක පරීක්ෂණයක් පැවැත්විය යුතුය.
- JMO විසින් පරීක්ෂණයට පෙර ඔබෙන් හෝ ඔබේ භාරකරුගෙන් වලංගු, දැනුවත් ලිඛිත අනුමැතියක් ලබා ගත යුතුය. එය අනිවාර්ය වේ. *
- වෛද්‍ය පරීක්ෂණයට කැමැත්ත ලබා දෙන්නේද? නැතිද? කියා JMO විසින් ඔබෙන් අසනු ඇත. කැමැත්ත ලබා දීමට හෝ නොදීමට ඔබට අයිතියක් ඇත. කැමැත්ත නොදෙන සමහර අවස්ථාවලදී අනිවාර්ය වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීමට මහේස්ත්‍රාත්වරයාගෙන් නියෝගයක් ඉල්ලා සිටීමට පොලිසියට හැකිය.**







*ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය විසින් හඳුන්වා දෙන ලද අධිකරණ වෛද්‍ය අරමුණු සඳහා ලිංගික අපයෝජනයට ලක් වී ශේෂිත පුද්ගලයන්ගේ පරීක්ෂණ, වාර්තා කිරීම සහ කළමනාකරණය සඳහා වන ජාතික මාර්ගෝපදේශය (2014) බලන්න.

** අධිකරණ වෛද්‍ය අරමුණු සඳහා ලිංගික අපයෝජනයට ලක් වී ශේෂිත පුද්ගලයන්ගේ පරීක්ෂණ, වාර්තා කිරීම සහ කළමනාකරණය සඳහා වන ජාති මාර්ගෝපදේශය (2014) බලන්න

GENDER JUSTICE & SECURITY
A GCRF HUB

- ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වූ ශෝෂිතයකු සහ සැකකටයුතු අපරාධකරුවකු හැකි ඉක්මනින් අධිකරණ වෛද්‍ය නිලධාරියකු/ රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පරික්ෂාවට ලක් කිරීමට මහේස්ත්‍රාත්වරයකුගේ මැදිහත් වීම අනිවාර්ය ('කළ යුතු') වේ.

- ශෝෂිතයා (ඔබ) විසින් වෛද්‍ය පරීක්ෂණයේ කිසිම අංශයකට එකඟ නොවන්නේ නම් අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් ඒ බව ලේඛනගත කර ඊට අත්සන් තබන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ඇත.

- ශෝෂිතයා වෛද්‍ය පරීක්ෂණයට අනුමැතිය නොදෙන්නේ නම් පොලිසියට මහේස්ත්‍රාත්වරයාගෙන් නියෝගයක් ඉල්ලා සිටිය හැකි බව කරුණාවෙන් සලකන්න. (අපරාධ නඩු විධාන සංග්‍රහයේ 137 වගන්තිය බලන්න.)

- පරීක්ෂණය අවසන් වූ පසු JMO විසින් සම්පූර්ණ කරන ලද අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය (MLEF) පරීක්ෂණයේ ප්‍රතිඵල සමඟ පොලිස් නිලධාරියා වෙත යවනු ලැබේ.

- (වෛද්‍ය පරීක්ෂණ ක්‍රියා පටිපාටිය පිළිබඳ විස්තර සඳහා, අධිකරණ වෛද්‍ය අරමුණු සඳහා ලිංගික අපයෝජනයට ලක් වී ශෝෂිත පුද්ගලයන්ගේ පරීක්ෂණ, වාර්තා කිරීම සහ කළමනාකරණය සඳහා වන ජාතික මාර්ගෝපදේශය (2014) බලන්න.)

- (ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය විසින් හඳුන්වා දෙන ලදී.)



GENDER JUSTICE & SECURITY
A GCRF HUB

- පුහුණුව ලත් වින්නඹු මාතාවක්, හෙදියක් හෝ ඔබට පහසුවක් ඇති වෙනත් සෞඛ්‍ය සේවකයකු ඔබත් සමඟ වෛද්‍ය පරීක්ෂණයට පැමිණ සිටිය යුතුය. එවැනි පුද්ගලයකු පැමිණ නැත්නම්, එවැන්නකු කැඳවන ලෙස ඉල්ලා සිටින්න.

- රහස්‍යභාවය සඳහා ඔබ සතු අයිතිය අත්හැරීමට ඔබ එකඟ වන්නේ නම් වෛද්‍ය පරීක්ෂණයට පවුලේ සාමාජිකයකුට, මිතුරකුට හෝ නීතිඥයකුට පැමිණෙන්නැයි ඉල්ලා සිටිය හැකිය. (කෙසේ වෙතත් වර්තමාන මාර්ගෝපදේශ අනුව JMO විසින් ඔබේ ඉල්ලීම සලකා බැලීමට පමණක් බැඳී සිටින නමුත් එයට ඉඩ දීමට බැඳී නොසිටින බව කරුණාවෙන් සලකන්න.)

- වෛද්‍ය පරීක්ෂණය අවසන් වූ පසුව JMOගේ නම සහ තනතුර, පරීක්ෂණය පැවැත්වූ දිනය සහ ස්ථානය සඳහන් රිසිට් පතක් JMO වෙතින් ලබාගත යුතුය.

- JMO විසින් ඔබව මනෝ වෛද්‍යවරයකු වෙත යොමු කළ යුතුය.

- JMO විසින් ඔබව ලිංගාශ්‍රිත රෝග සායනයකට හෝ වෙනත් වෛද්‍ය/සහාය සේවාවක් වෙත යොමු කළ යුතුය.

- මේ සායන වෙත යොමු කිරීමේ අරමුණ ඔබට JMO විසින් පැහැදිලි කළ යුතුය.



# අධිකරණ ක්‍රියාවලිය

- ඔබ අපරාධ නීතිඥයකු නොදන්නේ නම් කාන්තා සංවිධානයක උපකාර ලබා ගත හැකිය. (කාන්තා පිහිට - Women in Need) වැනි) නැත්නම් නීති ආධාර සංවිධානයක් (නීති ආධාර කොමිෂන් සභාව වැනි) අමතා නීති ආධාර ඉල්ලා සිටින්න. ඔබත් සමඟ උසාවියට යැමට හිතෛෂිවන්තයකුගෙන් සහ/හෝ නීතිඥයකුගෙන් ඉල්ලා සිටින ලෙසත්, ඔබේ නඩුවට අදාළ පොලිස් නිලධාරියා විසින් කරුණු ඉදිරිපත් කරන බවට සහතික කරගත යුතු බවට ඔබට උපදෙස් ලැබෙනු ඇත.



- පොලිස් ස්ථානවල අධිකරණ අංශය විසින් අපරාධ සම්බන්ධ සියලුම ලිපි ලේඛන හසුරුවනු ලබන අතර, අධිකරණයට යනු ලබන්නේ ද මෙම අධිකරණ අංශයේ පොලිස් නිලධාරීන්ය. ඔවුන් විසින් (පළමුව) 'බී වාර්තාව' සහ පසුව 'වැඩිදුර වාර්තා ' ගොනු කරන්නේ විමර්ශනවල වර්ධනය පිළිබඳ මහේස්ත්‍රාත්වරයා දැනුවත් කිරීමටය. එමෙන්ම ඔවුන් අධිකරණය හමුවට ගොස් අදාළ විධාන/නිර්දේශ ලබා ගනී.

- ඔබට යම් හිරිහැරයක් හෝ අනාරක්ෂිත බවක් දැනේ නම් ඒ බව ඔබේ නීතිඥවරයාට දැනුම් දී 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීම පනත යටතේ ආරක්ෂාව ලබා ගත හැක. මෙම පනත යටතේ, ඔබ "අවදානමකට ලක්විය හැකි අපරාධයක වින්දිතයකු" (යම් ලිංගික හිංසනයක වින්දිතයකු වීම නිසා) ලෙස සැලකීමට ද ඉල්ලුම් කළ හැකි අතර එමඟින් ඔබේ ආරක්ෂාව සඳහා විශේෂ ක්‍රියාමාර්ග තීරණය කිරීමට අධිකරණයට ඉඩ තිබේ.




- අධිකරණයට පෙනී සිටීමේදී සැරසිය යුතු ඇඳුම් පැලඳුම් සහ අපේක්ෂිත හැසිරීමත්, අධිකරණ ක්‍රියාවලිය තුළ අපේක්ෂා කළ යුතු දේ පිළිබඳවත් ඔබට නීතිඥවරයාගෙන් විමසා දැනගත හැකිය.

- ඔබේ පැමිණිල්ල ආරම්භයේදී භාරගන්නා පොලිස් නිලධාරියා මූලික සාරාංශගත පරීක්ෂණයේදී සහ ඉන් අනතුරුව මහාධිකරණ නඩු විභාගයේදී මහේස්ත්‍රාත් අධිකරණයේ සාක්ෂිකරුවකු ලෙස පමණක් කැඳවනු ලැබේ.
- අධිකරණ ශාඛාවේ පොලිස් නිලධාරීන් එකවර නඩු කිහිපයක් හසුරුවන බැවින් නඩුව විභාග කිරීමේ කාල වකවානුව අතර පරතරයක් ඇති විය හැකිය. එපමණක් නොව උසාවියට පැමිණෙන නිලධාරියා ඔබේ පැමිණිල්ල සටහන් කළ හෝ ඔබේ නඩුව විභාග කළ පුද්ගලයා නොවිය හැකිය.
- ඔබේ නඩු විභාගය/ නඩුව පුරාවට විවිධ නිලධාරීන් අධිකරණයේ පෙනී සිටිය හැකිය. මන්දයත් පොලිස් නිලධාරීන් වෙනත් ස්ථාන වෙත මාරු කර යැවිය හැකි බැවින්.
- එබැවින් මුල සිටම ඔබේ පැමිණිල්ල පිළිබඳ දැනුවත්, අධිකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කරමින් හිතෛෂිවන්තයකු සහ/හෝ නීතිඥයකු ඔබ සමඟ රැඳී සිටින ලෙස කටයුතු කිරීමට වගබලා ගන්න.
- අගතියට පත් පාර්ශවයක් ලෙස නීතිඥයකු මාර්ගයෙන් අධිකරණයේ පෙනී සිටීමට ශෝෂිතයාට අයිතියක් ඇත. (අපරාධ නඩු විධාන සංග්‍රහ පනත, 260 වගන්තිය; ජගත්සේන සහ වෙනත් අයට එදිරිව ජී.ඩී.ඩී. පෙරේරා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂක සහ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය. (අගතියට පත් පාර්ශවය) (1992) 1 SLR 371) බලන්න).



- 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත, අපරාධවලට ගොදුරු වූවන්ගේ මූලික අයිතිවාසිකම් සහ හිමිකම් කිහිපයක් ද පිළිගනී.

- සමානාත්මතාවයෙන් හා සාධාරණත්වයෙන් යුතුව සැලකීමේ අයිතිය සහ ඔවුන්ගේ ගෞරවයට හා පෞද්ගලිකත්වයට ගරු කිරීමට ඇති අයිතිය, විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳව දැනුම් දීම, අධිකරණ ක්‍රියාදාමය සහ අධිකරණ ක්‍රියාදාමයේදී කටයුතු වලදී නීතිඥයෙකු විසින් නියෝජනය කිරීමේ අයිතිය, වින්දිත බලපෑම් ප්‍රකාශයක් මෙන්ම වන්දි ගෙවීමේ අයිතිය පිළිබඳ ඔවුන්ට දැනුම් දීමේ හිමිකම ද ඊට ඇතුළත්ය.

- ලිංගික හා ස්ත්‍රී/පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට අදාළ දණ්ඩ නීති සංග්‍රහය (364) යටතේ වරදකරු වූ පසුව විත්තිකරු විසින් ශේෂිතයාට වන්දි ගෙවීමට නීතියෙන් විධිවිධාන සලසා ඇත.



# කණ්ඩායම

- **මහාචාර්ය නෙලුෆර් ද මෙල්**
  *(සම අධ්‍යක්ෂ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය සහ ආරක්ෂක මධ්‍යස්ථානය සහ ඉංග්‍රීසි දෙපාතර්මේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය)*

- **ආචාර්ය ජීන් පෙරේරා**

  *(ජ්‍යෙෂ්ඨ උපදේශක, ව්‍යාධිවේදය සහ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය.*

  *අධිකරණ වෛද්‍ය හා විෂ විද්‍යා අංශයේ විශ්‍රාමික (සභාපති)* **මහාචාර්ය**, *කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව)*

- **රනිතා ඥානරාජා**

  *(නීතිඥ)*

- **සඳනි යාපා අබේවධර්න**

  *(නීතිඥ)*

- **හැරී ප්‍රනාන්දු**

  *(කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය)*

- **රුවංගි අමරසිංහ**

  *(ෆෝල්ඩ් මාධ්‍ය සාමූහිකය)*